සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |
| කාලය / காலம் / Time: පැය 02 | | |

නම :- ............................................ විභාග අංකය :- ............................

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තයි.
- I කොටසේ සියලු ම ප්‍රශ්න සඳහා මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

## I කොටස

- අංක 01 සිට 05 තෙක් දී ඇති ප්‍රකාශවලට ගැළපෙන රූපය A, B, C, D, E යන රූප අතරින් තෝරා එහි ඉංග්‍රීසි අක්ෂරය තිත් ඉර මත ලියන්න.


A


B


C


D


E

(01) නියද කෙඳි භාවිතයට ගෙන කරනු ලබන කලා කර්මාන්තයකි ............................

(02) ළමුන් අතර ජනප්‍රිය රූපවාහිනී කාටූන් වැඩසටහනකි. ............................

(03) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සේ සැලකෙන තන්තිරිමලේ ලෙනකින් උපුටා ගත් සිතුවමකි ............................

(04) තුල් රූකඩ කලාව ශ්‍රී ලංකාවේ පාරම්පරිකව පැවත එන ජනප්‍රිය කලාවකි. ............................

(05) බිතු සිතුවම්වල හිස්තැන් පිරවීමට මෙන් ම විහාර සිවිලිම් අලංකාර කිරීමට බෙහෙවින් යොදා ගත් මෝස්තරයකි ............................

- අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද තිත් ඉරමත ලියන්න.

(06) මැටි මාධ්‍යයෙන් මූර්තියක් නිර්මාණය කිරීමේ දී එය වියලුණු පසුව ආධාරක කම්බිය ඉවත් කළ යුතු වේ. (     )

(07) ලජ්ජතිස්ස රජතුමා විසින් රුවන්මැලි මහා සෑය වටකොට ථූපඝරයක් ගොඩනගන ලදී. (     )

(08) කොළ, දම්, තැඹිලි යනු මූලික වර්ණ වේ. (     )

(09) ඉවතලන විවිධ ද්‍රව්‍ය ඒකරාශී කර එකලස් කිරීමේ ශිල්ප ක්‍රමයට නිර්මාණය කළ හැකියි. (     )

(10) පාසලේ නාම පුවරුවක් නිර්මාණය කිරීමේ දී වඩාත් උචිත වන්නේ වෘත්තාකාර අක්ෂර යෙදීමයි. (     )

226

- අංක 11 සිට 15 තෙක් දී ඇති වචනවලට සුදුසු රූප සටහන **F, G, H, I, J** යන රූප සටහන් අතරෙන් තෝරා යා කරන්න.

(11) වටදාගෙය

(12) මිනාර්

(13) ත්‍රිමාණ ලක්ෂණ

(14) ගෝපුර

(15) රෝමන් දේවස්ථානය

F



G



H



I



J



The National e-learning Portal for The General Education

- අංක 16 සිට 20 තෙක් දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

(16) පොළොන්නරු යුගයට අයත් රන්කොත් වෙහෙර .................................................... හැඩයෙන් යුක්තයි.

(17) තල්කොළ පැදුරු කර්මාන්තයේ දී විවිධ වර්ණ යොදා මංගල අවස්ථාවන් සඳහා වියන පැදුරු ........................................ නමින් හැඳින්වේ.

(18) සැජුෆෝම් මාධ්‍ය භාවිත කර අනවශ්‍ය කොටස් කපා ඉවත් කරමින් කරනු ලබන කැටයම් ........................................ ශිල්ප ක්‍රමයට අයත් වේ.

(19) චිත්‍ර සංරචනය කිරීමේ දී ළඟ සහ දුර දක්වීමේ චිත්‍රමය සිද්ධාන්තය ............................................ නමින් හැඳින්වේ.

(20) සම්ප්‍රදායික සැරසිලි නිර්මාණ දිව්‍ය, සත්ත්ව, උද්භිද හා ........................................ යනුවෙන් ප්‍රධාන කොටස් හතරකට බෙදා වෙන් කෙරේ.

(ලකුණු 2 x 20 = 40)

227

## II කොටස

- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

### 'අ' චිත්‍ර සංරචනය

(01) බෞද්ධ, හින්දු, ඉස්ලාම් හෝ ක්‍රිස්තියානි ආගමික උත්සවයක සිත්ගත් අවස්ථාවක්

(02) ඇලක හෝ ගඟක බැස දිය නාන මිතුරියන් සමූහයක්

(03) ශ්‍රමදානයක යෙදෙන මිනිසුන් පිරිසක්

(04) වනයේ සැරිසරන සතුන්

### 'ආ' මෝස්තර හා ග්‍රැෆික් චිත්‍ර

(05) මල් පොහොට්ටු සහ කොළ භාවිතයෙන් චීත්ත රෙද්දක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක්

(06) බුමුතුරුණක් සඳහා මුළුතල මෝස්තරයක්

(07) ස්වාභාවික හා වියුක්ත හැඩතල භාවිතයෙන් මේස රෙද්දකට සුදුසු මෝස්තරයක්

(08) පාසලේ වාර්ෂිකව පැවැත්වෙන චිත්‍ර ප්‍රදර්ශනය සඳහා උචිත දැන්වීමක් නිර්මාණය කරන්න.

(ලකුණු 1 x 60 = 60)

| | | |
|---|---|---|
| I. කොටස | 2 x 20 | = 40 |
| II. කොටස | | = 60 |
| මුළු ලකුණු | | = 100 |